# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/28 - 2018 ජනවාරි මස 10 වැනි බදාදා - 2018.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* KDS/MDB/4/2/1/79/06
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 13/97/FR/244.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම:

මධ්‍යම පළාතේ  මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩසියපත්තුව දකුණ සුළු කොට්ඨාසයේ මාංගොඩ (806) ග්‍රාම නිලධාරි වසමේ මංගොඩ ගමේ පිහිටි, මහනුවර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ මූලික පිඹුරු අංක මහ 6718 හා 2017.10.20 දිනැති පිඹුරේ කැබලි අංක 01. 02, 03 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.6586ක් වූ අඟුරුකොළවත්ත නැමැති ඉඩම

01.  **කැබලි අංක 01**

ඉඩමේ නම: අඟුරුකොළවත්ත; ඉඩමේ විස්තරය: ලදු කැළය; හිමිකම් කියන අය: නො. 11, මිනිපේ පාර, මැදමහනුවර පදිංචි එම්. එෆ්. ඒ. ආබ්දීන් ;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0160

02.  **කැබලි අංක 02**

ඉඩමේ නම: අඟුරුකොළවත්ත; ඉඩමේ විස්තරය: ලදු කැළය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 3.4561

03.  **කැබලි අංක 03**

ඉඩමේ නම: අඟුරුකොළවත්ත; ඉඩමේ විස්තරය: ලදු කැළය; හිමිකම් කියන අය: නො. 11, මිනිපේ පාර, මැදමහනුවර පදිංචි එම්. එෆ්. ඒ. ආබ්දීන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1865

ඉහත සඳහන් ඉඩමට, හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2018 මාර්තු 14 වැනි දින පෙ. ව. 10.00ට මැදදුම්බර  ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2018.03.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයෙන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලත් දැනුම් දිය යුතුය.

ඒ. එම්. වික්‍රමාරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2017 දෙසැම්බර් 06 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01– 686

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G26920– 39 (2017/12)

ශුද්ධි පත්‍රිකාවයි

**තංගල්ල රණවිරු ස්මාරකය ස්දහා ඉඩම් අත්කර ගැනීම**

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම් සංශෝධනය**

*මගේ අංකය:* DST/LND/1/21.

ඉහත කරුණට අදාල වූ 2016.12/27 දිනැති අංක 1999/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත වගන්තිය යටතේ වූ දැන්වීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

එහි සඳහන් මු.පි.හ. 69 හා 2016.09.07 දිනැති කැබලි අංක 01 යන්න මු. පි. හ. 69 හා 1986.05.06 දිනැති කැබලි අංක 01 වශයෙන් සංශෝධනය විය යුතුය.

එන්. ඩබ්. යාපා,
ප්‍රාදේශීය ලේකම්,
තංගල්ල.

2018 ජනවාරි මස 04 වැනි දින,

01– 687

ශුද්ධි පත්‍රය

**1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*මගේ යොමු අංකය:* HAK/LAN/1/12

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ 2017 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 2042/29 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* III වන කොටසේ පළ කරන ලද මගේ යොමු අංක HAK/LAN/1/12 සහ 2017 ඔක්තෝබර් 23 වැනි දින දරන දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාවද, වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළයුතු දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

*9 වන වගන්තිය හිමිකම පරීක්ෂණ දිනය හා වේලාව* : 2018.01.31 දින පෙරවරු 10.00

*වන්දි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය*

2018.01.24 දින පෙරවරු 10.00

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2017 දෙසැම්බර් මස 20 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01– 688

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.